

පත්තරයකට වඩා වැඩි යමක්

සංස්කාරක - Editor
**චන්ද්‍රරත්න බණ්ඩාර**
Chandrarathna Bandara

වෙබ් අඩවි සංස්කාරක: **රුචින්ද්‍ර අබේතුංග**

රූ රටා සංස්කරණය: **සමන්ත ගමගේ**

ඡායාරූප සංස්කාරක: **නිමල් එගොඩ ගෙදර**

පරිඝනක අක්ෂර සංයෝජනය: **චන්දිමා පීරිස්**

දුරකථනය: **416-994-2393**
Email: **yathranews@gmail.com**
Web: **www.yathranews.com**

Address:
**50-2080A, LAWRENCE AVE (EAST)**
**TORONTO, ONTARIO, M1R2Z5**

# බිව්ව නේද වදකහ සුදිය

**රාජකීය** විද්‍යාලය වසර දෙසීයක් වයසය. එය ශාන්ත තෝමස් විද්‍යාලය හා ගැටෙන මහා කිකට් තරගයට වයස අවුරුදු අනූවකි. ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ වයස අවුරුදු හැත්තෑ හතරකි. මහළු ජනාධිපතිවරයාගේ සැඟවුණු තරුණකම ඉස්මතු කෙරෙන එක ස්ථානයකි රාජකීය ශාන්ත තෝමස් ක්‍රිකට් ගැටුම. මේ මෑතක දී ජනාධිපති රනිල් වික්‍රමසිංහ මෙවැන්නක් පැවසුවේය. තමා පාසල් වියේ දී තවත් මිතුරන් සමූහයක් කැටුව රාජකීය ශාන්ත තෝමස් මහා ක්‍රිකට් තරඟයක් අතරතුර විශාඛා විද්‍යාලයට කඩා වැදුණු බවකි ඒ. අතීතයේ කටයුතු වලින් කුල්මත් වූ එතුමා තමා සමස්ත රටේම ජනාධිපති බව අමතක වී දැයි අපි නොදනිමු. තමන්ගේ පාසලේ කීර්තිමත් (?) ආදි ශිෂ්‍යයා අතීතයේ කළ දෙය වර්තමාන රාජකීය ශිෂ්‍යයෝ නොපමාවම අත්හදා බැලුවේ මෙවර ඔවුන්ගේ මහා ක්‍රිකට් තරඟය දා මියුසියස් බාලිකා විද්‍යාලයට කඩා වදිමිනි. කඩා වැදුනු ශිෂ්‍යයන්ගේ ඒ රාජකීය ක්‍රියාවට පොලිසිය පැවසුවේ අපි ශිෂ්‍යයන්ගේ කටයුතු දෙස බලන්නේ වෙනත්ම විදිහකට කියාය. එහෙත් මේ සිදුවීම දෙමටගොඩ වේලුවන ශිෂ්‍යයන් අතින් හෝ මරදාන මධ්‍ය මහා විද්‍යාලයේ සිසුන් අතින් සිදුවන්නේ නම් පොලිසියේ ශිෂ්‍ය ප්‍රතිපත්තිය එසේම ක්‍රියාත්මක වේදූ?

ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන එකී පදවියට පත්වූයේ ඔහුගේ වයස හැත්තෑ දෙකේ දී ය. ඒ අනුව මාමයි බෑණයි දෙදෙනාම ලංකාවේ රජ වී ඇත්තේ සම වයස්වලදීය. ඔහුද රාජකීයයෙකි. ඔහුද රාජකීය විද්‍යාලය මෙරට උසස්ම විද්‍යාල ලෙස සලකා කටයුතු කළේය.

ජේ.ආර්. තමා කැමතිම ගීය ජෝන් ද සිල්වා නිශ්පාදනය කළ සිරිසඟබෝ නාට්‍යයේ 'දන්නෝ බුදුන්ගේ' ගීතය ලෙස ප්‍රකාශ කර තිබුණි. එකළ විද්‍යුත් ජන මාධ්‍යයකට තිබුණේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව පමණකි. ජනාධිපතිගේ ශ්‍රී මුඛයෙන් තමා කැමති මෙම ගීතය යැයි පවසා සිටි විගසින්ම එය දවසකට දහ දොළොස් වාරයක් ගුවන් විදුලියෙන් ප්‍රචාරය කරන්නට පටන් ගත්තේය. එහෙයින් එම ගීතය නිතර ඇසෙන නිසා ම කිසියම් ජනප්‍රියතාවයකට ද පත් විය.

එදා ජනාධිපති ජාතිය අමතන්නේ නම් ආරම්භයේ දී ත් අවසානයේ දී ත් දන්නෝ බුදුන්ගේ ගීතය වාදනය කිරීමේ සිරිතක් හෝ නියමයක් එකළ විය.

අද ජනාධිපති රනිල් වික්‍රමසිංහගේ ජනප්‍රියතම ගීතය 'බිව්ව නේද වදකහ සුදිය' බව පෙනෙන්නට සලස්වා තිබේ. ඔහුගේ කැමති ම ගීතය සමහර විට එය විය නොහැකිය. එහෙත් ඔහුගේ ඉල්ලීම පරිදි ඔහුගේ සතුට වෙනුවෙන් ඒ ගීතය මෙවර ගැයුණි.

වදකහ සුදියට ඉතිහාසයක් තිබේ. එකදහස් නවසිය පනස් පහේ ජූනි 20 වන දින ලංකාවට පූර්ණ සූර්ය ග්‍රහණයක් උදාවිය. එක්දහස් නවසිය පනස් පහේ ජූනි දහනව වෙනිදා ඉරිදා ලංකාදීපයේ මුල්පිටුවේ සූර්ය ග්‍රහණ වේලාවේ පානය කිරීමට අපූරු බෙහෙතක් යෝජනා කර තිබුණි. ඒ වදකහ යුෂයයි. එය කොත්තමල්ලි වතුර කළවම් කර බිව්වොත් රූප සොබාව වැඩි වී තරුණ වන බව එහි සඳහන් විය.


එකළ තරුණයෝ බොහෝ ගණනක් එම උපදෙස් පිළිගෙන පිළිපැද්දෝය. ඩී.බී. ධනපාල වැනි කීර්තිමත් කතෘවරයෙකු කතෘකම් කරන වගකිවයුතු පුවත් පතක සඳහන් වූ විට එය විශ්වාස නොකරන්නේ කවුද? ප්‍රතිඵලය වූයේ බිව් වදකහ සුදිය නිසා දස දහස් ගනන් ජනයාට පාචනය සෑදී රෝහල් පිරී ඉතිරී යාමයි.

වගකිව යුතු පත්තරයක වගකීමක් නොමැති ක්‍රියාවක් නිසා දහස් ගණන් ජනයා රෝගී වූ අතර උසුළු විසුළුවලටත් ලක් විය. ඩී.බී.ධනපාල වැනි විශිෂ්ට පුවත්පත් කතුවරයෙකුත් එසේ කළා නම් 'කවුරුත් පුද්ගලයාගේ හැටි දන්නා ' අපේ ජනාධිපතිතුමා ඊට අදාළ ගීතය තෝරි ගැනීම වරදකුත් නැත.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා, මේ ගීතය මේ අවස්ථාවේ තෝරා ගැනීම රට පුරා ප්‍රචාරය වන බව නොදන්නවා විය නොහැකිය. එසේ නම් ඔහු මේ ගීතය තෝරාගෙන තමන්ගේ ජනතාවට ඔච්චම් කරන්නේද? ඔහු ජනාධිපති වශයෙන් තෝරා ගැනීමමත් රටක් වශයෙන් වදකහ සුදියේ හොඳම එක බීමකි. පාර්ලිමේන්තු ආසන එකක්වත් නොලැබෙන සේ ඉක්ම ගිය මැතිවරණයේ තම පක්ෂය මෙහෙය වූ ඔහුට ජනාධිපති පදවිය පිරිනැමීම ගැන ඔහු පොහොට්ටු නියෝජිතයන්ට සිනාසෙන්නේද?

රටක ජනාධිපතිවරයෙකු යනු තමන්ගේ පැරණි නිදහස තමන් විසින්ම අහුරා ගත්තෙකි. තමන්ගේ අතීත සෙල්ලක්කාරකම් ඉවසිය හැකි නෑදෑ මිතුරු කවයෙන් එහාට ගොස් රාජ්‍යය නම් වූ සමස්ත භූමි භාගයන්හි විවිධ ජන වර්ග, ආගම්, කුල, දුප්පත් පොහොසත් සියලු දෙනාගේ අභිලාෂයන් නොකෙලසන තැන්පත් ගාම්භීර වෘතයක් ඔහු පිරිය යුතුය. 1977 න් පසු බිහි වූ සියලුම ආණ්ඩු නායකයන් මේ වැදගත් නියමය කඩ කළේය. ජේ.ආර්., ප්‍රේමදාස, මහින්ද, චන්ද්‍රිකා, මෛත්‍රීපාල දූන් රනිල් සියල්ලම පාහේ මේ නියමය කඩ කළ නායකයෝය.

5 වෙනි පිටුවට....





දිනමිණ
THE DINAMINA
TUESDAY JUNE 21, 1955
'සූර්ය ග්‍රහණ කසාය' බී
# දසදහස් ගණන් ලෙඩ වෙති
දස් ගණන් රෝහල්වල: 'වට්ටෝරුව ඉරිදා ලංකාදීපයෙන්'

**යාත්‍රා අන්තර්ගතය.**

යාත්‍රා පුවත්පතේ පළකරන ආගමික විශ්වාසයන් හා එවැනි පාරභෞතික කාරණා ඇතුළත් ලිපි, වෙළෙඳ දැන්වීම් ආදියෙහි අන්තර්ගතයන් පුවත්පතේ අදහස් නියෝජනය නොකරයි. එමෙන්ම ඒ ඒ ලිපිවල දේශපාලන ආස්තානයන්ද පුවත්පතේ අදහස් නොව එවා ලියන ලේඛකයන්ගේ හා ආයතනවල අදහස් බව සැලකව මනාය. අප මේ විවිධත්වයට ඉඩ සලසා දෙන්නේ සෑම අදහසක්ම දැන ගැනීමේ පාඨක අයිතියත්, ඒවා සමාජය හමුවේ පැවතීමේ අයිතියත් අප පිළිගන්නා හෙයිනි.

**සංස්කාරක**

